මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

# සිංහල - II

**5 වසර** | කාලය පැ: 03 යි

**I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II කොටසින් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. අ) දී ඇති පාඨ ලිහිල් බසින් ලියා නැවත ඉරි ඇඳි පදවල අර්ථ වෙන වෙන ම ලියා දක්වන්න.

i. "ඒ තුෂිත දිව්‍ය ලෝකයෙහි ප්‍රමාණාතික්‍රාන්ත උතුම් දිව්‍යාංගනාවන් විසින් සලනු ලබන්නා වු මනෝඥ දිව්‍ය චාමර ප්‍රභා සමූහයෙන් සුදු කරන ලද තුෂිත භවන ඇති ඒ මහා පුරුෂ තෙමේ...." (ලකුණු 04)

ii. "නිර්මල වූ මාණික්‍ය වූ භූමියෙහි පෙනෙන්නාවූ ප්‍රතිබිම්බ ඇති බැවින් වල්ලභයා කෙරෙහි ස්නේහයෙන් මහී කාන්තාව විසින් ළෙන් උසුලන්නාක් වැනි වූයේ ....... " (ලකුණු 04)

iii. "යම් සේ කේශර සිංහ රාජයෙක් තෙමේ ලාක්ෂාරසයෙන් පිරියම් කරන ලද්දාක් වැනි වු, මුඛය හා අග්‍රවාලධිය හා සතර පා කෙළවර ද යුක්ත වූයේ...." (ලකුණු 04)

iv. "ඒ නිර්මල ප්‍රභා ඇති සර්වඥයන් වහන්සේ පිරිවරා හුන්නාවු සකහිත පරහිත දෙක දැන්මෙහි සමර්ථ වු ශ්‍රමණ සමූහයෙන් සියල්ලෝ ගුණයෙන් යුක්ත වන බැවින් අල්පේච්ඡ යහ..." (ලකුණු 04)

v. "මෙසේ අනේක ප්‍රකාර වු ආශ්චර්‍ය්‍ය වු ප්‍රාතිහාර්‍ය්‍යයෙන් සත්ත්වයන් විනයනය කොට, සූවිසි අසංඛ්‍යයක් දිව්‍ය මනුෂ්‍යයන් නිර්වාණ නමැති අමෘතය පානය කරවමින් බුදු වු තැන් පටන් විසි අවුරුද්දකට පැමිණි සේක," (ලකුණු 04)

vi. "කෙළන ළඳුන් සොමි වුවනින් දිනනු වට
මෙන් තුරුසෙන් ගෙන එන පුන් තරිඳු හට (ලකුණු 04)

vii. "පුන් සඳ කිරන එත නුබ ගඟ වතුර ලෙස
නන් කොඳ කුමුදු සමගව දිලෙත තුරු රැස (ලකුණු 04)

viii. දිමුත් සඳලුවල කෙළනා ළඳ අද ර
සුරත් බැබැළි බිඹු පල යයි කර අද ර (ලකුණු 04)

ආ) **පහත දැක්වෙන උද්ධෘතවල අවස්ථා සම්බන්ධය ලියන්න.**

ix. "ස්වාමිනි ! නුඹ වහන්සේ සැරිසරා වැඩි කල්හි මේ ජේතවන මහවිහාරය කුසල් කැමති සත්ත්වයනට පිළිසරණ නොවෙයි. මනුෂ්‍යයෝ පිදියැ යුතු ස්ථානයක් නොලබති" (ලකුණු 04)

x. "වෙහෙර තුළට සෙද නොගොසින් පළමු කොට
පවර සුරිඳු නඳුනුයනෙව් දිසි අවට
නිතොර සුසැදි මල් පල රම් වන පෙතට
මිතුර පිවිස නරඹව සිත් සතුටු කොට" (ලකුණු 04)

## II කොටස

02. ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් සිංහල බෝධිවංශය උසස් තැනක තැබිය හැකි නිර්මාණයකි. නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

03. සිංහල බෝධිවංශය රසවත් සාහිත්‍ය නිර්මාණයක් ලෙස හඳුන්වා දීම කොතෙක් දුරට සාධාරණ ද යන්න නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

04. "ගිරා සන්දේශ කතුවරයා තුළ වූ හැකියාව වඩාත් හොඳින් ප්‍රකට වන්නේ ස්වභාව සෞන්දර්‍ය වර්ණනයන් හි දී ය." අදාළ වැනුම් දෙකකින්වත් උදාහරණ දෙමින් ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 15)

05. "කෝට්ටේ යුගයට අයත් සමාජය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් ගිරා සන්දේශයෙහි ඇතුළත් ය." නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

06. "පියදාස සිරිසේනගේ ඩිංගිරි මැණිකා නවකතාව, පිරිහෙමින් පැවති සංස්කෘතියේ පුනර්ජීවනයට අරමුණු කරගත් ප්‍රබන්ධයකි" නිදසුන් සහිත ව විමසන්න.

(ලකුණු 15)

07. "තමන් ජීවත් වූ සමාජයෙන් ලද අත්දැකීම් කොළඹ යුගයේ බොහෝ කවීන් සිය කාව්‍ය නිර්මාණ සඳහා වස්තු විෂය කරගෙන තිබේ" පද්‍යාවලී ඇසුරින් නිදසුන් සහිත ව විමසන්න.

(ලකුණු 15)

08. එස්. මහින්ද හිමි, විමලරත්න කුමාරතුංග, සාගර පලන්සූරිය යන කවීන් අතරින් එක් අයෙකුගේ පද්‍ය නිර්මාණවල විශේෂත්වය පද්‍යාවලී ඇසුරින් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)